සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

### 4 වසර / Grade 4

**භූගෝල විද්‍යාව**
**Geography**

කාලය : පැය තුනයි
Time: Three hours

❖ **I වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**01.** (අ) සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

i. ගාල්ල දිස්ත්‍රික්කය
ii. වලවේ ගඟ
iii. මන්නාරම දූපත
iv. ත්‍රිකුණාමල වරාය
v. පේදුරු තුඩුව
vi. පුත්තලම කලපුව
vii. ඉන්දියන් සාගරය
viii. අනුරාධපුරය
ix. කල්පිටිය
x. මහ ඉලුප්පල්ලම

(ලකුණු 10)

(ආ) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. ලංකාවේ කුඩා ම දිස්ත්‍රික්කය සහ විශාල ම දිස්ත්‍රික්කය නම් කරන්න.
ii. ලංකාව පිහිටා ඇති අක්ෂාංශ හා දේශාංශ දක්වන්න.
iii. ලංකාවේ ගංවතුර තර්ජනයට ලක්වන ප්‍රධාන දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
iv. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිවේගී මාර්ග දෙකක් නම් කරන්න.
v. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රම දෙකක් නම් කරන්න.
vi. ඕසෝන් ස්ථරයෙන් ඇති ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
vii. පෘථිවි ග්‍රහයාට දෙපසින් ඇති ග්‍රහලෝක දෙක නම් කරන්න.
viii. වනාන්තර විනාශ වන ක්‍රම දෙකක් දක්වන්න.
ix. ලෝකයේ මහාද්වීප දෙකක් නම් කරන්න.
x. ලෝකයේ ඇති සාගර දෙකක් නම් කරන්න.

(ලකුණු 10)

**02.** (i). කාලගුණය හා දේශගුණය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii). කාලගුණය මිනිසාගේ වැඩකටයුතුවලටත්, මිනිසාගේ ක්‍රියාකාරකම් කාලගුණයටත් බලපාන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 12)

**03.** (i). ස්වාභාවික සම්පත් යනු මොනවාදැයි උදහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii). රටක සංවර්ධනයට ස්වාභාවික සම්පත්වල ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 12)

**04.** (i). ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ස්වාභාවික වෘක්ෂලතා කලාප හතර නම් කරන්න. (ලකුණු 08)

(ii). වනාන්තරවලින් ඇති ප්‍රයෝජන දක්වා වර්තමානයේ වන විනාශය නිසා මුහුණපාන ගැටලු පැහැදිලි කරන්න. (ලකුණු 12)

**05.** (i). ජල චක්‍රයේ ප්‍රධාන අවස්ථා රූප සටහනකින් දක්වන්න. (ලකුණු 08)

(ii). ජලයෙන් ඇති ප්‍රයෝජන, ජලය දූෂණය වන ක්‍රම හා ජලය සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 12)

**06.** (i). සංචාරක කර්මාන්තයේ දියුණුවට ලංකාව අනුගමනය කරන ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii). ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ගැටලු හා නූතන ප්‍රවණතා පැහැදිලි කරන්න. (ලකුණු 12)

**07.** (i). ශ්‍රී ලංකාවේ දැකිය හැකි ස්වාභාවික ආපදා හතරක් නම් කරන්න. (ලකුණු 08)

(ii). ස්වභාවික ආපදා වර්ධනයට මිනිස් ක්‍රියාකාරකම් බලපාන අයුරු පැහැදිලි කොට ඉන් සිදුවන හානිය අවම කිරීමට ගතහැකි ක්‍රියා මාර්ග දක්වන්න. (ලකුණු 12)

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

**4 වසර / Grade 4**

**භූගෝල විද්‍යාව**
**Geography**

විභාග අංකය :.................................................

